ලක්බිම

සිමාසහිත ලක්බිම නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම.
කර්යාල මණ්ඩලය
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426000
ෆැක්ස් : 011 2441899, 011 2441897
ඊමේල් : daily@lakbima.lk

බෙදාහැරීම් අංශය
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426016, 0714 614003,
ෆැක්ස් : 011 2395484
ඊමේල් : circulation@lakbima.lk

'ලක්බිම' දැන්වීම් අංශය
සුමනි කෝට් 491, ගාලුපාර, කොළඹ -03
දුරකථන : 2597315, 4-521955/521954/521912
ෆැක්ස් : 4518313

කොටුව ශාඛාව – දැන්වීම්
අංක 12, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ-02 (රීගල් සිනමාහල අසල)
දුරකථන : 011 2439466 / ෆැක්ස් : 011 2439467
ඊමේල් : cityoffice@lakbim.lk

මහනුවර ශාඛාව – දැන්වීම්
35-$\frac{18}{2}$, නතීෂා වෙළෙඳ සංකීර්ණය
කොටුගොඩැල්ල වීදිය, මහනුවර
දුරකථන : 081 2215429
ෆැක්ස් : 081 2215429

ජාතිවාදී ගැටුම් මැඩීම රාජ්‍යයේ වගකීමයි..!

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන සැප්තැම්බර් සහ මාර්තු මාසවල මේ රටේ ජාතීන් අතර අසමගිය ඇතිවන ආකාරයේ සිදුවීම් වන බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගියදා ප්‍රකාශ කළේය. අම්පාරේ සිද්ධිය උදාහරණයට ගනිමින් අදහස් පළකර තිබූ ජනාධිපතිවරයා මෙවැනි සිදුවීම් නිසා රටේ කීර්ති නාමයට හානි සිදුවන බවද සඳහන් කළේය. මෙවැනි සිදුවීම්වලට සම්බන්ධ වන පුද්ගලයන්ට තරාතිරම නොබලා දඬුවම් ලබාදිය යුතු බවද ජනාධිපතිවරයා අවධාරණය කර තිබිණ.

අම්පාරේ සිද්ධිය හෝ ඊට සමාන ආකාරයේ වෙනත් සිදුවීම් කිසියම් ලෙසකින් සංවිධානාත්මකව සිදුවී තිබේ නම් එය බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතු දෙයකි. අප දැනට දන්නා පරිදි අම්පාරේ සිද්ධිය කොත්තු රොටියක් මුල්කර ගනිමින් ඇතිවූ හුදකලා සිදුවීමකි. එය පසුව සංවිධානාත්මක ස්වරූපයක් ගත් නමුත් කල්තියා සැලසුම් කළ දෙයක් බව පෙනෙන්නට නැත. නමුත් රටේ විධායක ජනාධිපතිවරයාට අනුව සැප්තැම්බර් සහ මාර්තු සිදුවන ජාතිවාදය ඇවිස්සෙන ආකාරයේ දේවල් සංවිධානාත්මකව සිදුවන දේවල්ය. එබැවින් මේ තත්ත්වය අඩු ලංසුවෙන් තක්සේරු කළ හැකි නොවේ. මේ කතාව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කියන්නට කලින් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද මේ ආකාරයේම කතන්දර කියා තිබේ. එසමයෙහි වූ අතුරුදන්වීම්, පැහැර ගැනීම් බොහොමයක් සිදුවූයේ ජිනීවාහි මානව හිමිකම් කොමිසම රැස්වී සිටින අවස්ථාවලදීය. රජයේ අනුග්‍රහය ලද අතුරු සන්නද්ධ කල්ලි විසින් කරන ලද බවට හෙළිදරව් වෙමින් පවතින එවැනි අපරාධ වෙනත් පිරිසක් කළ බවට අනුමාන කරමින් හිටපු ජනපතිවරයා කළ අදහස් පළකිරීම් සබුද්ධික ජනයා පිළිගත්තේ නැත. මිලිටරි බලය උපරිම ලෙස උපයෝගී කොටගත් සමස්ත පාලන තන්ත්‍රයක් සිවිල් සමාජය මත බරපතළ ලෙස සිය ආධිපත්‍යය පතුරුවාගෙන සිටි එසමයෙහි රාජ්‍යයේ අනුදැනුමකින් තොරව අතුරුදන්වීමක්, පැහැර ගැනීමක් සිදුවී යැයි අබැටක් තරමේ හෝ මොළයක් ඇත්තෙකු විශ්වාස කළේ නැත.

එම පාලන තන්ත්‍රය පැවැතියේ ජාතිවාදය සහ ජාතිකත්වය පදනම් කරගනිමිනි. සිංහල බෞද්ධ නොවන ජාතීන් සම්බන්ධයෙන් පැවැතියේ යහපත් ආකල්පයක් නොවේ. බේරුවල සිදුවීම ඇතුළු තවත් අවස්ථා කිහිපයකදී එය සමාජයේ මතුපිටම ප්‍රදර්ශනය විය.

මේ ආණ්ඩුව බලයට පත්වීමත් සමග රාජ්‍ය බලය සහ රාජ්‍ය අනුග්‍රහය යටතේ කෙරුණු අන්‍ය ජාතීන් පීඩාවට පත්කරන සිදුවීම් අවම විය. නමුත් තැන් තැන්වල සුළු සුළු දේ වුවද අම්පාරේ අන්දමේ දෙයක් වූයේ නැත. ජාතීන් අතර සමගිය සහ සංහිඳියාව ගොඩනැගීම සඳහා බලයට පත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා දැන් කියන්නේ තමන්ගේ පාලනය යටතේද සංවිධානාත්මකව එවැනි සිදුවීම් වන බවය. ඉන් ගම්‍ය වන්නේ මෙම තත්ත්වයන් පාලනය කිරීම සඳහා රාජ්‍ය පාලනයට අවශ්‍ය සහය දෙන ඔත්තු සේවා ආරක්ෂක අංශ නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව හෝ එම ක්ෂේත්‍රයන් අකර්මන්‍ය වී තිබෙන බවය. මේ ආකාරයේ ගැටුම් සංවිධානාත්මකව සිදුවන්නේ නම් කල්තියා ඒ පිළිබඳ සොයා බලා ඒවා වාර්තා කිරීම සහ ඒවා වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම ආරක්ෂක අංශවල වගකීමකි. පවතින පාලන තන්ත්‍රයේ දායකත්වය හෝ අනුග්‍රහය නොලැබෙන්නේ නම් එවැනි දේ අනාවරණය කරගැනීම එතරම් දුෂ්කර කටයුත්තක් නොවේ. එබැවින් විධායක ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුවේ වගකීම වනුයේ එවැනි දේ සංවිධානාත්මක වන බවට අඳෝනා නැගීම නොවේ. ජාතිවාදය ඇවිලීම සඳහා කැස කවන බලවේග කවරේදැයි නිශ්චිත ලෙස හඳුනාගෙන ඒවා පාලනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමය. ඔවුන් කවුරුන්දැයි රටටත්, ලොවටත් අනාවරණය කිරීමය. නොඑසේ නම් සංවිධානාත්මකව ඒ ආකාරයේ සිදුවීම් වන බවට අඳෝනා නැගීමෙන් සිදුවන්නේ රාජ්‍යයේ අකර්මන්‍ය භාවය නිර්ලජ්ජිත ලෙස ලොව ඉදිරියේ ප්‍රදර්ශනය වීමය.

ප්‍රායෝගික ගැටලු රැසක්ම පුංචි ඡන්දෙන් මතුවුණා

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් වීමත් සමග ඒ හා සම්බන්ධ ප්‍රායෝගික ගැටලු කිහිපයක්ම මතුවිය. කාන්තා නියෝජනය, අතිරේක මන්ත්‍රී පිරිසක් බිහිවීම ආදිය ඉන් කැපී පෙනිණි. එබැවින් ඉදිරි මැතිවරණයකදී නීති ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය ලක්විය යුතු කාරණා කිහිපයක් සම්බන්ධයෙන් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා දක්වන ලද අදහස් ඇසුරින් මෙම ලිපිය සැකසිණි.

ඡන්දය දෙන ස්ථානයට
வாக்களிப்பு நிலையத்
TO THE POLLING

තනි දේශපාලන පක්ෂයක් බහුතරය ලබා නොගැනීම හේතුවෙන් දුර්වල ආයතන ව්‍යුහයක් ඇතිවී තිබේ.

ඉකුත් පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල අනුව පෙනී ගිය ප්‍රධාන කාරණාවක් වූයේ එක් දේශපාලන පක්ෂයක් හෝ බහුතර බලය දිනාගැනීමට අසමත් වීමය. එම ප්‍රතිඵලවලට අනුව තනි දේශපාලන පක්ෂයක් 50% වැඩි සභික ධුර ප්‍රමාණයක් ලබා තිබුණේ පළාත් පාලන ආයතන 138ක පමණි. එය මුළු පළාත් පාලන ආයතන සංඛ්‍යාවෙන් 40%ක ප්‍රතිශතයක් පමණි. පළාත් පාලන ආයතන 34ක, තනි පක්ෂයක් අදාළ සභික සංඛ්‍යාවෙන් 50%ක් ලබාගෙන තිබුණ නමුත් ඔවුන්ටද බාහිර සහයකින් තොරව සභා පිහිටුවිය නොහැකිය. පළාත් පාලන ආයතන 170ක සියලු දේශපාලන පක්ෂ හිමිකරගෙන තිබුණේ 50%ට අඩු සභික ධුර සංඛ්‍යාවකි. එම ආයතනවල බලය කුමන කණ්ඩායමක් විසින් පිහිටු වුවද ජාතික දේශපාලන චලනයන් සමග වෙනස්විය හැකිය. එනම් පළාත් පාලන ආයතනවලින් 50%ක් සන්ධානගත වීම අනිවාර්ය වනු ඇත. එමෙන්ම වව්නියාව, මන්නාරම, මුලතිව් හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල එකම සභාවක හෝ තනි පක්ෂයකට බලය පිහිටුවිය නොහැකිය.

කිසිදු දේශපාලන පක්ෂයක් බහුතරයක් ලබා නොගෙන සියලු දෙනාගේ සහභාගීත්වයෙන් සම්මුතියෙන් පාලනය වීම යහපත් දේශපාලන ලක්ෂණයක් වුවද ප්‍රායෝගිකව ප්‍රාදේශීය දේශපාලනයේදී ජනතාවගේ කඩිනම් අවශ්‍යතා සපිරීමට මෙම තත්ත්වය බාධාවක් විය හැක. එබැවින් කෙටි කාලීනව මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා ජාතික දේශපාලන නායකයන් තමන්ගේ කඳවුරු පිළිබඳ තීන්දුවකට කඩිනමින් පැමිණිය යුතුය. එසේ නොවුණහොත් සමහර පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් හෝ නගරාධිපතිවරුන් පත් කිරීම අසීරු වනු ඇත. එමෙන්ම පසුව ඇතිවන ජාතික දේශපාලන චලනයන් මත බොහෝ ආයතනවල බලය වරින්වර වෙනස්විය හැකිය.

දිගුකාලීනව මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා බෝනස් ආසන පිළිබඳව සහ අවම ඡන්ද ප්‍රමාණ පිළිබඳව Cutout point පිළිබඳව නැවත අවධානය යොමු කළ යුතුව ඇත. එය ප්‍රජාතන්ත්‍රවාදීව යම් ගැටලුකාරී තත්ත්වයක් වුවද ඒ සම්බන්ධයෙන් ගතහැකි විකල්ප පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

එල්ලන මන්ත්‍රීධුර

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී එල්ලන මන්ත්‍රීධුර ප්‍රමාණය 364ක් වී ඇත. එනම් එය මුළු සභික ප්‍රමාණයෙන් 4% වැඩිවීමකි. එමෙන්ම පළාත් පාලන ආයතන 340න් 196ක්ම එනම් 57%ක් එල්ලන සභික ධුර හෙවත් overhang තත්ත්වයක් උදාවී ඇත. (මහ නගර සභා 12ක්, නගර සභා 20 සහ ප්‍රාදේශීය සභා 164) එමෙන්ම මෙම තත්ත්වය වැඩිපුරම බලපා ඇත්තේ ප්‍රාදේශීය සභාවලටය. ප්‍රාදේශීය සභා 276කින් 164 එල්ලන සභිකයන් 299 පත්වී ඇත. එනම් ප්‍රාදේශීය සභා අතරින් 59%ම මෙම අතිරේක සභිකයන් පත්වී ඇත. කිසිදු අතිරේක සභිකයෙක් පත් නොවුණේ කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් පමණි. බහු මන්ත්‍රී කොට්ඨාස ඇති සෑම ස්ථානයකම මෙම තත්ත්වය ඇති විය හැකිය. මක්නිසාදයත් ජයග්‍රහණය කරන පක්ෂයේ ඡන්ද ප්‍රමාණයේ වැඩිවීමකින් තොරව එම පක්ෂයට අතිරේක එක් සභිකයෙකු හෝ දෙදෙනෙකු එකතු වන බැවිනි. එය බහු මන්ත්‍රී කොට්ඨාස නිසාම පමණක් ඇති වන තත්ත්වයක්ද නොවේ.

මෙවර ඡන්ද විමසීමේදී දෙදෙනෙකු සහිත බහු කොට්ඨාස 165 සහ තිදෙනෙකු සභික බහු කොට්ඨාස 4ක් ක්‍රියාත්මක වූ අතර එමගින් වැඩිවිය හැකි උපරිම ප්‍රමාණය 173කි. එහෙත් මෙවර අතිරේක සභිකයන් 366ක් පත්වී ඇත. එනම් 192 දෙදෙනෙකු වන බහුතරය පත් වී ඇත්තේ බහු සභික කොට්ඨාස හේතුවෙන් නොවේ. මෙයට හේතුවී ඇත්තේ අපගේ මැතිවරණ ක්‍රමය කොට්ඨාස පදනම් කරගත් සමානුපාතික ක්‍රමයක් වීම නිසාවෙනි. මෙම ක්‍රමය තුළ සභිකධුර ප්‍රමාණය පක්ෂ අතර බෙදාදීම 100% පක්ෂ ලබාගත් ඡන්ද ප්‍රමාණයට සමානුපාතික වුවද එම පත්කිරීමෙන් අනතුරුව එම සමානුපාතික බව නැතිවී යයි. මෙම තත්ත්වය බරපතළ වනුයේ එක පක්ෂයක් හෝ කණ්ඩායමක් ඉතා සමීප තරගයකින් කොට්ඨාස සියල්ල ජයග්‍රහණය කළ විටය. එනම් ඔවුන් ඡන්ද ප්‍රමාණ විශාල වැඩිවීමකින් තොරව කොට්ඨාස ජයග්‍රහණ කිරීම හේතුවෙනි. එබැවින් මෙම එල්ලන සභික ධුර ප්‍රමාණ මගහරවා ගැනීම සඳහා ගතහැකි එක ක්‍රමයක් වනුයේ සියලුම සභිකධුර සමානුපාතික ක්‍රමයට තෝරා ගැනීම වෙනුවට 60% කොට්ඨාස ප්‍රමාණ සඳහා වෙනම සභිකයන් පත් කිරීමත් එම ඡන්ද ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉතිරි 40% අදාළ සභික ප්‍රමාණ ඒ ඒ දේශපාලන පක්ෂ අතර බෙදා දීමත්ය. එමගින් ඡන්ද දායකයාගේ කොට්ඨාස මට්ටමේ තෝරා ගැනීම, එසේම තබාගනිමින් ඉතිරි 40% සමානුපාතිකව බෙදා දිය හැකිය.

ඡන්දදායකයන් රැවටීම

මෙවර ඡන්ද විමසීම තුළ අදාළ පළාත් පාලන බල ප්‍රදේශයෙන් පිට සිටින පිරිස් සහ දේශපාලනය පිළිබඳ කිසිදු අවබෝධයකින් තොර පිරිස් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ඉදිරිපත් කිරීමත් ඡන්දදායකයා දැන හෝ නොදැන ඔවුන් ජයග්‍රහණ කරවීමත් දැකිය හැකි විය. නව ක්‍රමය හඳුන්වා දීමේ එක් අරමුණක් වූයේ කොට්ඨාසයට වගකියන මහජන නියෝජිතයෙකු පත් කිරීමය. එහෙත් එම උත්සාහය මෙම ප්‍රතිඵලය දෙස බැලීමේදී අසාර්ථක වී ඇත.

> “මෙම තත්ත්වයට දේශපාලන පක්ෂවල නායකත්වය හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් සෘජුවම වගකිව යුතුව ඇත. ඔවුන් දැන දැනම ඡන්ද දායකයා නොමග යවා ඇත.”

මෙම තත්ත්වයට දේශපාලන පක්ෂවල නායකත්වය හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් සෘජුවම වගකිව යුතුව ඇත. ඔවුන් දැන දැනම ඡන්ද දායකයා නොමග යවා ඇත. එබැවින් අනාගතයේ මෙම තත්ත්වය වැළැක්වීම සඳහා අපේක්ෂකයා එම කොට්ඨාසයේම පදිංචි කරුවෙකු විය යුතු බවට නීති සම්පාදනය විය යුතු අතර ඒ බව සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය නාමයෝජනා ලබාදීමේදී අනිවාර්ය කළ යුතුය. එමෙන්ම සමහර අපේක්ෂකයන් තමා ජයග්‍රහණය කිරීමෙන් පසු ඉවත්වී තම පවුලේ හෝ වෙනත් ප්‍රාදේශීය ජනප්‍රිය දේශපාලන නායකයෙකුට තම සභික ධුරය ලබාදෙන බව ප්‍රකාශ කරමින් ප්‍රචාරණ කටයුතු සිදු කරමින් ඡන්දදායකයා නොමග යවමින් ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීමට උත්සහ කිරීම් වාර්තා විය. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එවැනි නොමග යැවීම් කරන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය හා සභිකත්වය අහිමි කිරීම සඳහා නීති සකස් විය යුතුව ඇත.

අභ්‍යන්තර ගැටලු

නව ක්‍රමයක් සමග ඡන්ද දායකයාට තිබූ වරණය අහිමි වූ අතර පක්ෂයට ලබා දෙන ඡන්දය හරහා පක්ෂ මගින් ඉදිරිපත් කළ ඕනෑම පුද්ගලයෙකුට ජයග්‍රහණය ලබා ගත හැකි වනු ඇත. එය මෙවර ප්‍රතිඵලවලින් සනාථ වී ඇත. දශක ගණනාවක් ජනතාවට සේවය කළ ජනතාවාදී පුද්ගලයන් මෙවර පරාජය වී ඇති අතර සමාජය පොදුවේ ප්‍රතික්ෂේප කරන පුද්ගලයන් තේරීපත් වී ඇත. මේ සඳහා අඩුම තරමින් පක්ෂ අපේක්ෂකයන් තේරීම සඳහා විනිවිදභාවයක් සහිත නිර්ණායකයක් සකස් කළ යුතු අතර අපේක්ෂකයන්ට පොලිස් සහතික අනිවාර්යය කළ යුතුව ඇත. එය නීතිගත කිරීම අපහසු නම් දේශපාලන පක්ෂ සම්ප්‍රදායක් ලෙස හෝ කළ යුතුව ඇත.

එමෙන්ම මෙවර මැතිවරණයේදී අපේක්ෂකත්වය අපේක්ෂා කළ පුද්ගලයන්ට ආසන සංවිධායකවරුන් ඉදිරියේ බැගෑපත් වීමට සිදු වූ බවත් කාන්තාවන් අපේක්ෂකත්වය ලබාගැනීමේදී ලිංගික අල්ලස් ඉල්ලූ බවටද චෝදනා එල්ල විය. ඡන්ද විමසීමෙන් අනතුරුව මෙම තත්ත්වය බරපතළ වී ඇත. සමානුපාතික ක්‍රමයට පත්වන සභිකයන් තීරණය කිරීම සඳහා ප්‍රායෝගිකව ආසන සංවිධායකවරුන්ගේ අභිමතයට විශාල ඉඩක් හිමි වී ඇති බැවින් ආසන සංවිධායකවරුන් ඉදිරියේ ප්‍රාදේශීය දේශපාලනඥයන් අසරණ වී ඇත. එමෙන්ම සභාපති / නගරාධිපති වැනි තනතුරු දීමේදීද ජ්‍යෙෂ්ඨත්වය, දැනුම, නිර්මාණශීලී භාවය හෝ නොසලකා දූෂණ චෝදනා ලැබූවන්ට පවා ප්‍රධාන තනතුරු ලබාදීමට ආසන සංවිධායකවරුන් කටයුතු කෙරන බව වාර්තා වේ. එබැවින් මෙම තත්ත්වය වළක්වාලීම පිළිබඳවද අවධානය යොමුකළ යුතුව ඇත.

වියදම් සීමා කිරීම

මෙවර මැතිවරණය සාපේක්ෂව ප්‍රචණ්ඩත්වය අඩු, රාජ්‍ය බලය භාවිතා වීම අවම මට්ටමක පැවැති, නීති උල්ලංඝනය වීම අවම මට්ටමක පැවැති මැතිවරණයක් වුවද අපේක්ෂකයන් හා දේශපාලන පක්ෂ ඡන්දදායකයන්ට භෞතික හා මානසික අල්ලස් ලබාදීම බහුලව දැකිය හැකි මැතිවරණයක් විය. මෙය මහන මැෂිමේ සිට ගෘහ උපකරණ දක්වාත්, කෘෂි උපකරණවල සිට ණය සහ සහනාධාර දක්වාත් එසේම රැකියා ලබාදීම්, විදුලි බිල්, ජල බිල් ගෙවීම් ඇතුළු පුළුල් පරාසයක ක්‍රියාත්මක විය. මෙම තත්ත්වය කොට්ඨාස ක්‍රමයකදී ඡන්දදායකයාට සෘජු බලපෑමක් හා අපේක්ෂකයාට සෘජු ලෙස වාසි ගෙන දෙන තත්ත්වයකි. එම නිසා ඉදිරි මැතිවරණයකට පෙර දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්ට මැතිවරණයකදී කළ හැකි වියදම් සඳහා උපරිම සීමා ඇතුළත් වන සේ නීති පැනවිය යුතුය.

අන්දැකීම් ප්‍රයෝජනයට

මේ වන විට පළාත් සභා 3ක නිල කාලය අවසන් වී ඇති අතර නව මැතිවරණ ක්‍රමයක් පළාත් සභා සඳහාද හඳුන්වා දී ඇත. එමෙන්ම පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය සංශෝධනයන් පිළිබඳවද දීර්ඝ සාකච්ඡා වට ගණනාවක් අවසන් වී ඇති අතර පාර්ලිමේන්තු මැතිවරණයද ඉදිරි වසර 2 1/2ක් තුළ පැවැත්වීමට නියමිතය. එබැවින් අපගේ නීති සම්පාදකයන් ප්‍රතිපත්ති සම්පාදකයන් පසුගිය මැතිවරණයේ, පැවැති නීතිමය දුර්වලතා, ප්‍රායෝගික ගැටලු, ව්‍යුහාත්මක ගැටලු, දේශපාලන ස්ථාවරභාවය බලපාන්නාවූ ගැටලු සහ විශේෂයෙන් ජනතාවගේ සැබෑ අභිලාෂය ආරක්ෂා වන ආකාරයේ මැතිවරණ ක්‍රමයක් පිළිබඳව කඩිනමින් සංවාදයක් ආරම්භ කළ යුතුය. එය පාර්ලිමේන්තුව තුළත්, ජනමාධ්‍ය තුළත්, සිවිල් සමාජය හා විශ්වවිද්‍යාල ප්‍රජාව මෙන්ම මැතිවරණ වෘත්තිකයන් තුළත් ඇති වියයුතුය. අප ඊළඟ මැතිවරණයට යා යුත්තේ එවැනි විධිමත් සංශෝධනයන් වලින් පසුව වන අතර එහෙත් ඒ මැතිවරණ කල් දැමීම සඳහා අවියක් නොවනසේ කාල රාමුවක් තුළ කළ යුතුය.

සැකසුම :
ගයාත්‍රි ගීගනආරච්චි